**ශීර්ෂය - 009 - පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය**

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මතය**

ශීර්ෂය 009 - පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 11 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අධිකාරයට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජූනි 08 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අධිකාරය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අධිකාරයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරයේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.71,960 ක්වූ අග්‍රිම ශේෂය භාණ්ඩාගාරයට පියවා තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂයක් නොතිබුණද මූල්‍ය ප්‍රකාශනවල ඒසීඒ 3 ආකෘතියේ 2022 දෙසැම්බර් 31 දිනට ආයතන පොත් අනුව අග්‍රිම ශේෂය ලෙස රු.71,960 ක් දක්වා තිබුණි. | නිරීක්ෂණ හා එකඟ වෙමි. 2023 වර්ෂයේ ගිණුම් ඉදිරිපත් කිරීමේදී නිවැරදිව සටහන් කිරීමට කටයුතු කරමි. | අග්‍රිම පියවීම ඒසීඒ-3 ආකෘතියේ නිවැරදිව සටහන් කළ යුතු වේ. |

### 2.2 වියදම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු පිළියෙල නොකිරීම හේතුවෙන් පුනරාවර්තන වැය විෂයයන් 04 ක සියයට 28 සිට සියයට 100 දක්වා පරාසයක ඉතිරිවීම් පැවතුණි. | පුනරාවර්තන වියදම් ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී ශක්‍යතා අධ්‍යයනයක් කර ඇස්තමේන්තු පිළියෙල කලද පසුගිය වර්ෂයේ රටතුල පැන නැගුණු අර්බුදකාරී තත්ත්වයන් හමුවේ ආයතන වසා දැමීම හා ඉන්ධන අර්බුදය හේතුවෙන් වාහන ධාවනය සීමාවීම නිසා අපේක්ෂිත අරමුණු ඉටුකර ගත නොහැකි වීමෙන් ඉතිරිවීම් සිදුව ඇත. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී වැය විෂයය 1003 - වෙනත් දීමනා සඳහා මුදල් රෙගුලාසි 208 යටතේ අනෙකුත් ශීර්ෂ විසින් කර තිබූ රු.12,000 ක වියදම අධිකාරය විසින් සිදු කළ වියදමක් ලෙස සලකා ඒසීඒ-2(ii) ආකෘතියේ මුදල් පොතට අනුව වියදමට එකතු කර දක්වා තිබුණි. | නිරීක්ෂණ හා එකඟ වෙමි. 2023 වර්ෂයේ ගිණුම් ඉදිරිපත් කිරීමේදී නිවැරදිව සටහන් කිරීමට කටයුතු කරමි. | මු.රෙ. 208 යටතේ දරන ලද වියදම ඒසීඒ -2(ii) ආකෘතියේ වෙනම සටහන් සටහන් කළයුතු වේ. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| (අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16.2 වගන්තිය | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කළ කාර්යසාධන වාර්තාවේ කෙටුම්පත මූල්‍ය ප්‍රකාශන සමඟ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අවසන් වාර්තාව ලැබීමෙන් පසු කාර්යසාධන වාර්තාව පිළියෙල කිරීමට කටයුතු යොදා ඇත. කෙසේ වෙතත් 2023 වර්ෂයේ ගිණුම් ඉදිරිපත් කිරීමේදී මූල්‍ය ප්‍රකාශන සමග කාර්ය සාධන වාර්තාවේ කෙටුම්පතක් ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | විගණන පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | සෑම මුදල් වර්ෂයකම පෙබරවාරි 26 දිනට පෙර පොදු 47 වාර්තාව අනුව විනාශ කළ යුතු භාණ්ඩ, අලුත්වැඩියා කළ යුතු භාණ්ඩ, විකිණිය යුතු භාණ්ඩ හා වෙනත් රජයේ ආයතන වලට පැවරිය හැකි භාණ්ඩ සම්බන්ධයෙන් සුදුසු කටයුතු කර ඊළඟ වර්ෂයේ | පසුගිය වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේදී නුසුදුසු බවට ප්‍රකාශ කරන ලද භාණ්ඩ පිළිබඳ කටයුතු කිරීම ප්‍රමාද වූ අතර 2023 වර්ෂයේදී පොදු 47 වාර්තාව අනුව ක්‍රියා කිරීමට කටයුතු යොදා ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව පොදු 47 වාර්තාව අනුව කටයුතු කර භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | මාර්තු 17 දිනට පෙර පසුගිය වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් පොදු 47 වාර්තාව අනුව කටයුතු කිරීමකින් තොරව භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි. | | |
| (ඇ) 2020 අගෝස්තු 28 දිනැති අංක 2020/02 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය | අධිකාරය විසින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | 2022 වර්ෂයට රු.200,000ක මුදලක් වෙන්ව තිබූ එකම මූලධන වියදම දුරකථන පද්ධතිය නවීකරණය කිරීම සඳහා වූ අතර ලිපිද්‍රව්‍ය සුළු ප්‍රමාණයන්ගෙන් රාජ්‍ය විවිධ නීතිගත සංස්ථාවෙන් මිලදීගෙන ඇත. එබැවින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙළ කිරීම ප්‍රායෝගික නොවන බවද කාරුණිකව දන්වමි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඇ) 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | අධිකාරය විසින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ආයතනයේ සමස්ත කාර්ය මණ්ඩලය 18 ක් වන අතර ඉන් 07 ක් කොන්ත්‍රාත් පදනමින් සේවය කරන අය වේ. ඒ අනුව සේවකයන් පුහුණු කිරීමේ කටයුතු සඳහා යෙදවීම් හැකියාවක් නොමැති අතර, ඒ සඳහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන ලබා දීමක්ද සිදුකර නැත. එබැවින් මානව සංවර්ධන සැලැස්මක් පිළියෙල කිරීම ප්‍රායෝගික නොවේ. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඉ) 2022 අගෝස්තු 29 දිනැති අංක 02/2021 (vii) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | ඇඟිලි සළකුණු යන්ත්‍රයෙන් පැමිණීම හා පිටවීම සටහන් කිරීම වෙනුවට පැමිණීමේ පිටවීමේ ලේඛනයක් නඩත්තු කිරීම 2021 ඔක්තෝබර් 02 දින සිට 2022 ජනවාරි 02 දින දක්වා පමණක් විය යුතු බව දන්වා තිබුණද අධිකාරය 2022 ජනවාරි 02 සිට විගණිත දිනය වූ 2023 පෙබරවාරි 06 වන විටත් ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා කිරීම වෙනුවට පැමිණීමේ පිටවීමේ ලේඛනය නඩත්තු කර තිබුණි. | කොවිඩ් වසංගත තත්වය හමුවේ ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතය නොකර පැමිණීමේ ලේඛණයක අත්සන් තැබීම ප්‍රමාණවත් බව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ චක්‍රලේඛ 02/2021(iv) මගින් දන්වා තිබීම නිසා ඒ අනුව කටයුතු කර ඇත. ඉදිරියේදී ඇඟිලි සලකුණු යන්ත්‍රය මඟින් පැමිණීම පිටවීම සලකුණු කිරීමට කටයුතු කරමි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඊ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1 (අ) වගන්තිය | සමාලෝචිත වර්ෂයේදී රු.199,750 ක් වැය කර සිදු කර තිබූ කාර්යාලීය අභ්‍යන්තර දුරකථන පද්ධතිය නවීකරණය කිරීමේ ප්‍රසම්පාදන කාර්යය සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කර නොතිබුණි. | ආයතන 3 කින් සීමිත මිල ගණන් කැඳවා අවම මිල වූ රු.199,750 ට මෙම කාර්ය ඉටුකරගන්නා ලදි. ඒ සඳහා තාක්ෂණික දැනුම ඇති නිලධාරියෙකු අධිකාරයේ නොසිටීමත්, පිටස්තර ආයතනයක සේවය ලබා ගන්නේ නම් ගෙවීම් කිරීමට මුදල් නොමැති වීමත් මත තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් නොකළෙමි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1(අ) වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරය විසින් 2022 වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම 2020 අගෝස්තු 28 දිනැති අංක 2020/02 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයට අනුකූල නොවීය. | 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2014 අනුව පිළියෙල කළ අතර, 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම නියමිත ආකෘතිය අනුව පිළියෙල කිරීමට කටයුතු යොදා ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතු වේ. |

### 3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2002 අංක 04 දරන පරිපාලන අභියාචන විනිශ්චය අධිකාර පනතේ 7 වන වගන්තිය අනුව අධිකාරය වෙත ඉදිරිපත් කරන ලද අභියාචනයක් එම අභියාචනය ලැබී මාස 2 ක් ඇතුළත විභාග කර අවසාන වශයෙන් සුදුස්සක් කළ යුතු බව සඳහන්ව තිබුණද අධිකාරයට ලැබී තිබූ අභියාචනා වලින් 2022 දෙසැම්බර් 31 දිනට වර්ෂ 01 සිට වර්ෂ 03 ට අඩු විසඳීමට පවතින අභියාචනා 412 ක්ද වර්ෂ 03ට වැඩි වර්ෂ 05 ට අඩු විසඳීමට පවතින අභියාචනා 354 ක් ද හා වර්ෂ 5 ට වැඩි විසඳීමට පවතින අභියාචනා 47ක්ද පැවතුනි. | 2022 වර්ෂයේ රටේ උද්ගතව පැවති අරගලකාරී තත්ත්වය මත ඇඳිරි නීතිය ක්‍රියාත්මක වීම, තෙල් අර්බුදය හමුවේ ගමනාගමනය සීමාවීම වැනි හේතුන් මත අභියාචන කැඳවීම සීමා වුවද ලද අභියාචනා අතුරින් අභියාචනා 208 ක් විසඳීමට හැකිව තිබුණි. අධිකාරය පිහිටුවීමට අදාල පනතේ 7 වන වගන්තිය අනුව අභියාචනයක් ලද දින සිට මාස 02ක් තුල විභාග කර අවසාන වශයෙන් සුදුස්සක් කළ යුතු බව දක්වා තිබුණ ද නීතිපතිතුමා විසින් මේ පිළිබඳ අර්ථ නිරූපණය කරමින් දක්වා ඇත්තේ "පනතේ එසේ සඳහන් වුවද එවැනි විධිවිධාන විධානාත්මක නොවන බවත් උපදේශාත්මක බවත්ය " | පනතේ 7 වන වගන්තිය ප්‍රකාරව අධිකාරය වෙත ඉදිරිපත් කරන යම් අභියාචනයක් එය ලැබුණු දින සිට මාස 02 ක් ඇතුළත විභාග කර යම් සුදුස්සක් කළ යුතු වේ. එසේ නොමැති නම් පනතේ එම වගන්තිය සංශෝධනය කිරීම සඳහා කටයුතු කළ යුතු වේ. |
| (ආ) | 2022 වර්ෂය තුල අධිකාරය වෙත ලැබී තිබුණු අභියාචනා 252 න් විසඳා අවසන් කර තිබුණේ අභියාචනා 06 ක් පමණි. එය ලැබුණු අභියාචනා වලින් සියයට 2.38 ක් පමණක් විය. | අභියාචක, අභියාචකගේ රැකවරණ නිලධාරී හෝ නීති නිලධාරීගේ කටයුතු කිරීමේ ප්‍රමාදයන්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව සහ පොලිස් කොමිෂන් සභාව විසින් නිරීක්ෂණ | අභියාචනා විසඳීම ප්‍රමාද වීමට බලපාන හේතු හඳුනාගෙන ඊට පිළියම් යොදමින් ප්‍රමාදය අවම කර ගත යුතු වේ. |

| | | |
|---|---|---|
| | ඉදිරිපත් කිරීමේ ප්‍රමාද හා අභියාචනා සංඛ්‍යාව වැඩිවීම නිසා දින ලබාදීමේ දී දිගු කල්ගතවීමත් රටේ පවතින සාමාජීය හා දේශපාලන ක්‍රියාකාරීත්වයත් නිසා විසඳුම් ලබාදීම ප්‍රමාදවීම නොවැලැක්විය හැකි බව සඳහන් කරනු කැමැත්තෙමි. | |

## 4. යහපාලනය

### 4.1 මහජනයා වෙත සේවා ඉටු කිරීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 10 වන වගන්තිය ප්‍රකාරව මහජනයාගේ අවශ්‍යතාවය හා ආයතනය පිළිබඳ චෝදනා හෝ ප්‍රසංශා පළකිරීමට නිල වෙබ් අඩවියක් මගින් පහසුකම් සලසා තිබිය යුතු වුවත් අධිකාරය ඒ අනුව කටයුතු කර නොතිබුණි. | මහජනයාට තොරතුරු දැන ගැනීමට හැකිවනු පිණිස වෙබ් අඩවියක් සකස් කර ගැනීම සඳහා කටයුතු කරමින් පවතී. | මහජනයාගේ අවශ්‍යතාවය හා ආයතනය පිළිබඳ චෝදනා හෝ ප්‍රසංශා පළකිරීමට නිල වෙබ් අඩවියක් මගින් පහසුකම් සලසා තිබිය යුතු වේ. |

## 5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 31 දිනට අධිකාරයේ අනුමත කාර්ය මණ්ඩලය 31 ක් වුවද තත්‍ය කාර්ය මණ්ඩලය 19 ක් වූ හෙයින් කාර්ය මණ්ඩලයේ 12 ක පුරප්පාඩු පැවතුණි. තනතුරු 7 ක් කොන්ත්‍රාත් පදනම මත සම්පූර්ණ කර තිබුණු අතර ඉන් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු වන ලේකම් තනතුර හා සහකාර ලේකම් තනතුර 2017 වර්ෂයේ සිටම කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා තිබුණි. | බඳවා ගැනීම් පටිපාටියක් අනුමත වන තුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමැතිය ලබා නොදේ. | අත්‍යාවශ්‍ය තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අධිකාරය පිහිටුවා වසර 20 කට අධික කාලයක් ගත වී තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එක් එක් තනතුර සඳහා බඳවා ගැනීමේ පරිපාටි සකස් කර නොතිබුණි. | මේ වන විට බඳවා ගැනීම් පටිපාටියක් කෙටුම්පත් කර, අනුමැතිය ලබා ගැනීම සඳහා අධිකරණ සේවා කොමිෂන් සභාවට යොමුකර ඇත. | බඳවා ගැනීමේ පරිපාටි අනුමත කරවාගෙන අවශ්‍ය තනතුරුවල බඳවාගැනීම් සිදු කළ යුතු වේ. |